සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව - I** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

<u>උපදෙස් :</u>

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

- **ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01 පෘථිවි වායුගෝලයේ දිවා හා රාත්‍රි කාලයේ උෂ්ණත්ව අන්තරය ඉහළ මට්ටමක පවතින වායු ස්තරය වන්නේ ............................................ යි. (අපරිවර්තිගෝලය / මෙසෝගෝලය / තාපගෝලය)

02 පෘථිවි ව්‍යුහයට අනුව 670 km සිට 2900 km අතර පිහිටා ඇත්තේ .................................................... යි. (ඉහළ ප්‍රාවරණය / පහළ ප්‍රාවරණය / පිටත හරය)

03 මිනිසාගේ පැවැත්ම සඳහා අවශ්‍ය වන ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය සිදුවන්නේ........................................................ තුළය. (ශිලාගෝලය / වායුගෝලය / ජෛවගෝලය)

04 පෘථිවි ගෝලයේ උතුරු හා දකුණු අක්ෂාංශ $30^o$ - $50^o$ අතර ව්‍යාප්ත වී ඇත්තේ ........................................................................ වනාන්තරය. (නිවර්තන / සෞම්‍ය කලාපීය / කේතුධර)

05 ශ්‍රී ලංකාවේ වගා කරන කෝපි, ගම්මිරිස්, බුලත්, එළවළු යන භෝග,................................................ භෝග වලට අයත් වේ. (වතු කෘෂිකාර්මික / සුළුඅපනයන / ප්‍රධාන අපනයන)

06 ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බෝට්ටු මිල දී ගන්නා රටක් වන්නේ ....................................................... යි. (දකුණු කොරියාව / නෙදර්ලන්තය / එක්සත් රාජධානිය)

07 වර්තමානයේ ශ්‍රී ලංකාවේ මුළු ශ්‍රම බලකායෙන් වැඩි පිරිසක් නිරත වී සිටිනුයේ ............................... අංශයේ රැකියාවල ය. (කෘෂිකාර්මික / කර්මාන්ත / සේවා)

08 ශ්‍රී ලංකාවේ උසස් තත්ත්වයේ පිඟන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නේ.................................................................. ය. (බෝල මැටි / කෙඕලින් / උළු ගඩොල් මැටි)

09 ලෝකයේ මධ්‍යම අප්‍රිකානු සහෙල් කලාපය තුළ....................................................... ආපදාව බහුලව දක්නට ලැබේ. (නියඟ / සුළි සුළං / අකුණු කුණාටු)

10 1 : 50 000 පරිමාණයට අනුව සකස් කළ ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියමක දිග හා පළල වන්නේ .................................................................. ය. (80 cm x 50 cm / 40 cm x 25 cm / 50 cm x 25 cm)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11 පෘථිවි ගෝලයේ උත්තර ධ්‍රැවයට වඩා දක්ෂිණ ධ්‍රැවය ආශ්‍රිත ප්‍රදේශ අධික සීතලකින් යුක්ත ය. ( නි / වැ )

12 ගොඩබිම පිහිටි ජලය පිරුණු ආවාට විල් ලෙස හඳුන්වන අතර, එහි කරදිය ජලය ඇති විට ඒවා අභ්‍යන්තර මුහුදු ලෙස හඳුන්වයි. ( නි / වැ )

13 ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ වැසියන් භූතල ජලය, නළ ළිං, ආඩියා ළිං හා වගා ළිං මගින් ගෙන වගාවට යොදා ගැනේ. ( නි / වැ )

14 පිලිපීන් දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිෆික් සාගරයේ දී සුළි කුණාටු හඳුන්වන්නේ විලිවිලීස් නමිනි. ( නි / වැ )

15 ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට වඩා වියළි කලාපීය දිස්ත්‍රික්කවල වර්තමානයේ ජන සංඛ්‍යා වර්ධනය ඉහළ මට්ටමක පවතියි. ( නි / වැ )

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල ''අ'' යන්න සහ ''ආ'' යන්න යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතා අනුව ගැළපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.

16 ''අ'' / ''ආ''

| ''අ'' භූ ලක්ෂණ | | ''ආ'' අයත් මහද්වීපය | |
|---|---|---|---|
| 1. | නල්ලබාර් තැන්න | A | අප්‍රිකා |
| 2. | නයිජර් ගඟ | B | ඕස්ට්‍රේලියා |
| 3. | ඇපිනයින් කඳු | C | ආසියා |
| | | D | යුරෝපා |

(1) CBA (2) BAD (3) CAD (4) DCB (.........)

17

| ''අ'' මූලික පාෂාණ | | ''ආ'' ද්විතියික පාෂාණ | |
|---|---|---|---|
| 1. | ආග්නේය | A | නයිස්, කිරිගරුඬ |
| 2. | අවසාදිත | B | හුණුගල්, ජිප්සම් |
| 3. | විපරීත | C | ග්‍රැනයිට්, බැසෝල්ට් |
| | | D | ඩොලමයිට්, ගැබ්රෝ |

(1) CBA (2) ADC (3) CAD (4) BCA (.........)

18

| ''අ'' ජනාධික කලාප | | ''ආ'' අයත් රට | |
|---|---|---|---|
| 1. | නැගෙනහිර ආසියාව | A | චීනය |
| 2. | දකුණු හා ගිණිකොණදිග ආසියාව | B | නෝර්වේ |
| 3. | වයඹ දිග යුරෝපය | C | එක්සත් රාජධානිය |
| | | D | ඉන්දියාව |

(1) DAB (2) ADC (3) ADB (4) CAB (.........)

19

| ''අ'' ලෝකයේ කපු වගා කරන රටවල් | | ''ආ'' අයත් ප්‍රදේශ | |
|---|---|---|---|
| 1. | ඇමරිකා එක්සත් ජනපදය | A | යැංසි |
| 2. | ඕස්ට්‍රේලියාව | B | නිව් කාසල් |
| 3. | චීනය | C | පංජාබය |
| | | D | ටෙක්සාස් |

(1) BDA (2) DBC (3) ADC (4) DBA (.........)

20

| ''අ'' බලාගාර | | ''ආ'' පිහිටි ස්ථාන | |
|---|---|---|---|
| 1. | ජල විදුලි බලාගාරය | A | නොරොච්චෝලේ |
| 2. | සුළං විදුලි බලාගාරය | B | බරුතකන්ද |
| 3. | තාප විදුලි බලාගාරය | C | ලක්ෂපාන |
| | | D | පුත්තලම |

(1) DCA (2) ADC (3) CDA (4) ACB (.........)

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21 කර්කටක නිවර්තනය හා මකර නිවර්තනය අතර ප්‍රදේශවල ............................................ දේශගුණය දක්නට ලැබේ.

22 මානුෂ සංවර්ධන දර්ශකය අනුව ලෝකයේ රටවල් සංවර්ධන කාණ්ඩ ............................................ බෙදා දැක්වේ.

23 උතුරු අමරිකාවේ ඇලස්කාවේ සිට දකුණු ඇමරිකාව දක්වාත්, නවසීලන්තයේ සිට ජපන් දූපත් ඔස්සේ ඇලස්කාව දක්වාත් විහිදෙන භූමිකම්පා කලාපය ............................................ නමින් හඳුන්වයි.

24 යපස්, ගල්අඟුරු, මිනිරන් යන ඛනිජ වර්ග අතරින් ලෝහමය ඛනිජය වන්නේ ............................................ ය.

25 රටක වාර්ගික, ආගමික, අපනයන සංයුතිය ආදී තොරතුරු නිරූපණය කිරීම සඳහා උචිත වන්නේ............................................ ප්‍රස්තාරයයි.

- **අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති හරස්කඩ රූප සටහන උපකාර කරගන්න.**




26 A රූප සටහනෙන් දැක්වෙන්නේ ............................................ බෑවුමකි.

27 B රූප සටහනෙන් දැක්වෙන්නේ ............................................ බෑවුමකි.

28 දිය ඇල්ලක් නිර්මාණය විය හැක්කේ ............................................ රූපයට අදාළ බෑවුමෙනි.

29 D රූප සටහනෙන් දැක්වෙන භූ ලක්ෂණය ............................................ වේ.

30 E රූප සටහනෙන් දැක්වෙන භූ ලක්ෂණය ............................................ නමින් හඳුන්වයි.

- **අංක 31 සිට 39 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

31 භූගත ජලය වැඩි ප්‍රමාණයක් රඳවා ගැනීමට හැකි වී ඇත්තේ මින් කවර පාෂාණ ස්ථරවල ද?

(1) හුණුගල් (2) ග්‍රැනයිට් (3) ගැබ්රෝ (4) නයිස් (.........)

32 වර්තමානයේ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම සඳහා බලපාන හරිතාගාර වායුවක් වන්නේ මින් කුමක් ද?

(1) ඔක්සිජන් (2) නයිට්‍රජන්

(3) කාබන්ඩයොක්සයිඩ් (4) හයිඩ්‍රජන් (.........)

33 තිර්යක් නිම්න හා ආයාතගාමී නිම්න ඔස්සේ ගංගා ගලා යාමේ දී නිර්මාණය වන ජලවහන රටාව වන්නේ මින් කුමක් ද?

(1) අරීය (2) ශාඛීය (3) ජාලාකාර (4) වලයාකාර (.........)

34 ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම අතර ස්පර්ශ උරුමයක් හා අස්පර්ශ උරුමයක් පිළිවෙලින් දැක්වෙන්නේ මින් කුමන පිළිතුරේ ද?

(1) වනෝද්‍යාන - මානව දයාව (2) සීගිරිය - දළදා මාලිගාව

(3) ආගන්තුක සත්කාර - පැරණි නගර (4) කාරුණික බව - මානව ගරුත්වය (.........)

35 ශ්‍රී ලංකාවේ වී වගා බිම් ඒකකයකින් ලබන අස්වැන්න වැඩි නිසා සහල් අතිරික්තයක් නිපදවන්නේ මින් කුමන කලාපයක ද?

(1) තෙත් කලාපය (2) වියළි කලාපය (3) අතරමැදි කලාපය (4) කඳුකර බිම් කලාපය (.........)

36 ආපදාවක් ඇති වීමට පෙර කාලගුණික විද්‍යාඥයින්ට චන්ද්‍රිකා තාක්ෂණය ආධාරයෙන් හඳුනාගත හැකි දේශගුණික උපද්‍රවය මින් කුමක් ද?

(1) ලැව්ගිනි (2) නායයෑම (3) සුළි සුළං (4) නියඟ (.........)

37 අන්තර්ජාතික සාගර නීතිය අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය මුහුදු සීමාවට අයත් වන්නේ වෙරළ සීමාවේ සිට කොපමණ දුරක් ද?

(1) නා.සැ. 12 (2) නැ. සැ. 24 (3) නා.සැ. 22 (4) නා.සැ. 200 (.........)

38. කබොක් මිශ්‍ර රතු පසේ ඉතා හොඳින් වැවෙන්නේ මින් කුමන භෝගය ද?

(1) තේ (2) වී (3) රබර් (4) පොල් (.........)

39 ආපදා කළමණාකරණ චක්‍රයට අනුව ආපදාවට ගොදුරු වූ ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම සිදු වන්නේ පහත සඳහන් කුමන අවස්ථාවක දී ද?

(1) පෙර සූදානම (2) ප්‍රතිචාර දැක්වීම

(3) යථා තත්ත්වයට පත් කිරීම (4) අවම කිරීම (.........)

- **40 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රකාශ උපයෝගී කර ගන්න.**

A - සූර්ය බලශක්ති භාවිතය

B - පොසිල ඉන්ධන ක්ෂය වී යාම

C - ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම

D - අන්තගාමී දේශගුණික ලක්ෂණ ඇතිවීම

එක් කරුණක වැඩි වීම වෙනත් කරුණක් කෙරෙහි සෘජුව බලපෑම් ඇති කරන ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර වනුයේ මින් කුමක් ද?

(1) B හා C (2) C හා D (3) C හා A (4) A හා B (.........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව - II

| නම/ විභාග අංකය: |
|---|

- මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්යය වේ. එහි (අ) , (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුයි.
- II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

අංක (i) සිට (v) දක්වා ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) සිතියමෙහි AB රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය කුමක් ද?
(දියබෙත්ම / නිම්නය / නෙරුව) (ල. 01)

(ii) සිතියමෙහි CD රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(දළ බෑවුම / මොහොර බෑවුම / අවතල බෑවුම) (ල. 01)

(iii) F අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද? (රක්ෂිත මායිම / පාෂාණ උද්ගතය / හේන) (ල. 01)

(iv) G සිට H දක්වා විහිදෙන කඩඉර මගින් දක්වා ඇත්තේ කුමක් ද? (උමග / දියබෙත්ම / අඩිපාර)
(ල. 01)

(v) සිතියම් ප්‍රදේශය තුළ වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති ස්වභාවික වෘක්ෂලතා වර්ගය කුමක් ද?
(ල. 01)

(vi) සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන ජලවහන රටාව කුමක් ද? (ල. 01)

(vii) සිතියමෙහි J, K හා L අක්ෂර වලින් කොටු කර ඇති ප්‍රදේශ තුන අතරින් උසින් වැඩි භූමි ප්‍රදේශය අයත් අක්ෂරය නම් කරන්න. (ල. 01)

(viii) සිතියම් ප්‍රදේශය ඇසුරෙන් පහත දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් "නි" යන්න ද වැරදි නම් "වැ" යන්න ද ලියන්න. (ල. 03)

a) සිතියම් ප්‍රදේශයේ වී වගා බිම් වලින් වැඩි කොටසක් හෙල්මලු ක්‍රමයට වගා කර ඇත. ( )

b) E අක්ෂරයෙන් දක්වා ඇත්තේ වැලිතලාවකි. ( )

c) සිතියම් ප්‍රදේශයේ බහුලව ව්‍යාප්තවී ඇති ව්‍යාපාරික භෝගය තේ වගාවයි. ( )

(ල. 10)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නයට ඉදිරියේ දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න.

(i) මහා බාධක කොරල් පරය - A, B, C

(ii) ඇමර්සන් වනාන්තරය - D, E, F

(iii) පිරනිස් කඳු වැටිය - G, H, J

(iv) ථාර් කාන්තාරය - K, L, M

(v) කොංගෝ ගඟ - P, Q, R (ල. 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතරින් නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න.

(i) භූගත ජල ද්‍රෝණිය - වනාතවිල්ලුව - A, B, C

(ii) සිංහරාජ වනාන්තරය - D, E, F

(iii) මිරිදිය මසුන් බෝ කරන මධ්‍යස්ථානය - දඹුල්ල - G, H, J

(iv) බෝල මැටි නිධියක් පිහිටා ඇති - කොච්චිකඩේ - K, L, M

(v) අඩුම ජන සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්කය - මුලතිව් - P, Q, R (ල. 05)

## II - කොටස

(02) පෘථිවි ව්‍යුහය දැක්වෙන රූප සටහනක් පහත දැක්වේ.




(i) රූප සටහනේ B සහ D අක්ෂරවලින් දක්වා ඇති කොටස් මොනවාදැයි පිළිවෙලින් නම් කරන්න. (ල. 02)

(ii) a) රූප සටහනේ පෙන්වා ඇති පෘථිවියේ B හා D ස්ථර දෙක වෙන් කෙරෙන C අක්ෂරයෙන් දක්වා ඇති සීමාව කුමක් ද? (ල. 01)

b) පෘථිවි කබොලේ විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(iii) a) පෘථිවි ශිලාගෝලයෙන් මිනිසාට ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල. 02)

b) මිනිස් කටයුතු නිසා ශිලාගෝලයට ඇතිවන පාරිසරික බලපෑම් දෙකක් පැහැදිලි කරන්න. (ල. 03)

(03) පහත දක්වා ඇත්තේ ගෝලීය ජල ව්‍යාප්තිය දැක්වෙන දළ සටහනකි.




(i) වැව්, පොකුණු, ගංගා, විල් ආදී ජලයත්, ග්ලැසියර් හා අයිස් තලවල තැන්පත් වී ඇති ජලයත් අයත් වන්නේ ඉහත රූප සටහනේ A, B හා C අක්ෂර අතරින් කවර කොටස් දෙකට ද? (ල. 02)

(ii) a) වර්තමානයේ වඩාත් දූෂණයට ලක් වෙමින් පවතින්නේ B හා C කොටස් වලින් කුමන කොටසේ ජලය ද?

b) එසේ දූෂණය වීමට බලපාන හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(iii) අනාගතයේ දී ලෝකයේ පිරිසිදු ජලය හිඟවීමේ ගැටළුව අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 05)

(04) පස මිනිසාට ප්‍රයෝජනවත් හා අත්‍යවශ්‍ය සම්පතකි. ශාක හා සත්ත්ව සංහතියේ පැවැත්ම රඳා පවතින්නේ මේ පස් තට්ටුව මතය.

(i) පස නිර්මාණය වීමට බලපාන සාධක දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) a) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බහුලව ඇති පස් වර්ගය නම් කරන්න.

b) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ බහුලව ඇති පස් වර්ගය නම් කරන්න.

c) පුත්තලමේ සිට මුලතිව් දක්වා වෙරළබඩ තීරයේ ඇති පස් වර්ගය නම් කරන්න. (ල. 03)

(iii) a) පස පරිහරණය කිරීමේ දී මතුවන ගැටළු දෙකක් නම් කරන්න.

b) පස සංරක්ෂණය කළ හැකි ආකාර දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

(05) මිනිස් ආර්ථික කටයුතු අතර ඉතා වැදගත් තැනක් නිෂ්පාදන කර්මාන්ත වලට හිමි වේ.




(i) ඉහත ලෝක සිතියමේ යකඩ හා වානේ කර්මාන්තයේ යෙදෙන A හා B අක්ෂරවලින් දක්වෙන රටවල් 2 පිළිවෙලින් නම් කරන්න. (ල. 02)

(ii) ලෝක සිතියමේ x, y හා z යන රටවල් නම්කර ඒවායෙහි යකඩ හා වානේ කර්මාන්තය ස්ථානගත වීමට බලපෑ ප්‍රධාන සාධකය බැගින් නම් කරන්න. (ල. 03)

(iii) a) යකඩ හා වානේ කර්මාන්තයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.

b) යකඩ හා වානේ කර්මාන්තයේ නව ප්‍රවණතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(06) ශ්‍රී ලංකාවේ මෑත කාලයේ සිට සත්ත්ව පාලනය කෙරෙහි විශේෂ අවධානය යොමු වී ඇත.

(i) ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනය දියුණු කිරීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා ඇති ස්ථාන දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකා ආර්ථිකයට කිරිපට්ටි පාලනය දියුණු කිරීමෙන් ලැබිය හැකි වාසි 03 ක් ලියන්න. (ල. 03)

(iii) a) ශ්‍රී ලංකාවේ කිරි ගොවියන් මුහුණ පාන ගැටළු දෙකක් දක්වන්න.

b) එම ගැටළු අවම කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

(07) භූවිකිරණය පෘථිවි වායුගෝලය තුළ රඳවා ගැනීමෙන් ඇතිවන හරිතාගාර ආවරණය පෘථිවිය තුළ ජීවීන්ගේ පැවැත්මට යහපත් වායුගෝලයක් නිර්මාණය කර ඇත. එසේ වුවද මිනිස් ක්‍රියාකාරකම් මඟින් ස්වභාවික හරිතාගාර ආවරණ ක්‍රියාවලිය තීව්‍ර වෙමින් පවතී.

(i) ස්වාභාවික හරිතාගාර ආවරණය පෘථිවියේ ජීවීන්ගේ පැවැත්මට උපකාරි වන ආකාර දෙකක් ලියන්න. (ල. 02)

(ii) ස්වාභාවික හරිතාගාර ආවරණය තීව්‍ර වීම කෙරෙහි බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

(iii) ස්වාභාවික හරිතාගාර ආවරණ ක්‍රියාවලිය තීව්‍ර වීම කෙරෙහි බලපාන මිනිස් ක්‍රියාකාරකම් අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 05)

(08) ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිට ම සංචාරක ආකර්ශණීය රටක් ලෙස හඳුනාගෙන ඇත.

(i) යාබද සිතියමේ අංක 01 සිට 07 දක්වා දැක්වෙන සංචාරක කලාප අතරින්,

a) පුරාණ නගර කලාපය හා

b) මහ කොළඹකලාපය දැක්වෙන අංක දෙක පිළිවෙලින් ලියන්න. (ල. 02)




(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි සංචාරක කර්මාන්තයෙහි ඇති වැදගත්කම පිළිබඳව කරුණු තුනක් ලියන්න. (ල. 03)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ දියුණුවට වර්තමානයේ දී එල්ල වී ඇති බාධක තුනක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 05)




(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (ඉ)




(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (අ) /10 + (ආ) /5 + (ඉ) /5 = /20

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

ශ්‍රේණිය/Grade : ......................

විභාග අංකය
சுட்டெண்
Index Number ......................................................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

(01) (අ)

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(iii) ..........................................................................................

(iv) ..........................................................................................

(v) ..........................................................................................

(vi) ..........................................................................................

(vii) ..........................................................................................

(viii) (a) ..........................................................................................

(b) ..........................................................................................

(c) ..........................................................................................

10

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | තාපගෝලය | 12 | නි | 22 | 4 කට | 31 | (1) |
| 02 | පහළ ප්‍රාවරණය | 13 | වැ | 23 | පැසිපික් ගිනිවළල්ල/ පරි පැසිපික් කලාපය | 32 | (3) |
| 03 | ජෛව ගෝලය | 14 | වැ | | | 33 | (3) |
| 04 | සෞම්‍ය කලාපීය | 15 | නි | 24 | යපස් | 34 | (1) |
| 05 | සුළු අපනයන | 16 | (2) BAD | 25 | බෙදූ වෘත්ත | 35 | (2) |
| 06 | දකුණු කොරියාව | 17 | (1) CBA | 26 | උත්තල | 36 | (3) |
| 07 | සේවා | 18 | (2) ADC | 27 | අවතල | 37 | (1) |
| 08 | කෙඹලින් | 19 | (4) DBA | 28 | C | 38 | (3) |
| 09 | නියඟ | 20 | (3) CDA | 29 | නිම්නය | 39 | (2) |
| 10 | 80cm x 50cm | 21 | නිවර්තන | 30 | කොත් කන්ද | 40 | (2) |
| 11 | නි | | | | | | |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

## II පත්‍රය

### I - කොටස

(01) (අ) (i) නිම්නය (01)  (ii) අවතල බෑවුම (01)  (iii) රක්ෂිත මායිම (01)
(iv) අඩිපාර (01)  (v) වනාන්තර (01)  (vi) ශාඛීය (01)  (vii) L (01)
(viii) a) නි (01)  b) වැ (01)  c) නි (01)

(ආ) (i) B  (ii) D  (iii) J  (iv) M  (v) P

(ඉ) (i) C  (ii) E  (iii) H  (iv) K  (v) R

### II - කොටස

(02) (i) B - සාගරික කබොල  D - ඉහළ ප්‍රාවරණය (ල. 02)
(ii) a) C - මොහොර විසින් අසන්තතිය (ල. 01)
b) ඛනිජ හා පාෂාණ වලින් සමන්විත වීම
මෙහි ඝනකම ඒකාකාරී නොවීම, සාගර වලදී 5km ක් ද මහද්වීප වලදී 60km පමණ ද වීම
ජෛව පරිසරය මගින් නිතරම වර්ධනය වීම (ල. 03)
(iii) a) මිනිසාට වාසස්ථාන තනා ගැනීමට
කෘෂිකාර්මික කටයුතු සඳහා (ල. 01)
b) මතුපිට භූ දර්ශනය වෙනස්වීම
භූමි හායනය, පාංශු ඛාදනය  කරුණු දෙක දැක්වීමට (ල. 02) විස්තර කිරීම (ල. 01) (ල. 05)

(03) (i) C හා A (ල. 02)
(ii) a) C (ල. 01)
b) කෘෂිකර්මාන්තයේ දී කෘමිනාශක වල් නාශක භාවිතය
කර්මාන්තවලින් විවිධ අපද්‍රව්‍ය එකතුවීම
කැලිකසල ජලාශවලට මුදා හැරීම (ල. 02) (ල. 03)
(iii) ජලය අර පිරිමැස්මෙන් භාවිතා කිරීම
ජලය අපිරිසිදුවීමේ ක්‍රම වැළැක්වීමට දායක වීම
ජලය අපිරිසිදුවීම වැළැක්වීමේ වැදගත්කම පිළිබඳව අන්‍යයන් දැනුවත් කිරීම
.. කරුණු තුනක් නම් කිරීමට (ල. 03)
ඉන් එකක් පැහැදිලි කිරීමට (ල. 02) (ල. 05)

(04) (i) මව් පාෂාණය, භූවිෂමතාවය, දේශගුණය
ශාක හා සත්ත්ව කොටස්, මිනිස් ක්‍රියා (ල. 02)
(ii) a) වියළි කලාපය - රතු දුඹුරු පස
b) තෙත් කලාපය - රතු කහ පොඩ්සොල පස
c) පුත්තලමේ - මුලතිව් දක්වා වෙරළබඩ - රතු කහ ලැටසොල් පස (ල. 03)
(iii) a) අධික ලෙස පාංශු ඛාදනය
පස ලවණී කරණය
පසේ ජලය රඳවාගත හැකි ප්‍රමාණය අඩු වීම
කෘමිනාශක වල්නාශක භාවිතය නිසා පස හායනයට ලක්වීම (ල. 02)
b) පසේ ආවරණ භෝග සිටුවීම
ඓන්ද්‍රීය පොහොර භාවිතය වැඩිදියුණු කිරීම
ගල් වැටි දැමීම, කුට්ටිකාණු කැපීම
තීරු වගා ක්‍රමය  කරුණු දෙක දැක්වීමට (ල. 02)
කරුණු දෙක විස්තර කිරීම (ල. 01) (ල. 05)

(05) (i) A - රුසියාව B - බ්‍රසීලය (ල. 02)

(ii) ජපානය - ආනයන අපනයන කටයුතු සඳහා
වරාය පහසුකම් හා වෙළෙඳපොළ පැවතීම
ඇමරිකා එ. ජ - පරිවහනය සඳහා විල් ජලය භාවිතා කළ හැකි වීම
මහා බ්‍රිතාන්‍යය - වරාය පහසුකම් තිබීම (ල. 03)

(iii) a) යකඩ හා වානේ වල විශේෂ ගුණ ලක්ෂණ තිබීම (කල් පැවැත්ම, නම්‍යශීලී බව)
වෙනත් ලෝහ වලට මිශ්‍ර කිරීමේ හැකියාව තිබීම
භාවිතයෙන් පසුව ප්‍රතිචක්‍රීකරණය කළ හැකි වීම (ල. 02)

b) නැගෙනහිර ආසියාතික රටවලින් ඉහළ ඉල්ලුමක් තිබීම, අතීතයේ ප්‍රමුඛ රටවල් ක්‍රමයෙන් පසුබැසීම
අපනයනය කරන රටවල් ද ආනයනය කිරීම
කර්මාන්ත ස්ථානගත වීමේ සාධක වර්තමානයේ වෙනස් වීම
කරුණු දෙකට (ල. 02)
කරුණු දෙක විස්තර කිරීමට (ල. 01) (ල. 05)

(06) (i) අඹේවෙල කනන්විල, වල්පිට (ල. 02)

(ii) ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළයාම
රැකියා අවස්ථා ලබාදීම
වගාවට යොදාගත නොහැකි ආන්තික බිම්
ප්‍රයෝජනයට යොදා ගැනීම
කෘෂිකර්මයට අවශ්‍ය පොහොර ලබාදීම (ල. 03)

(iii) a) සත්ත්ව ආහාර මිල අධික වීම
උසස් වර්ගවල දෙනුන් සීමාවීම
කිරි ප්‍රවාහනයේදී ගැටළු ඇති වීම
කල්තබා ගැනීමේ ක්‍රම දියුණු නොවීම (ල. 02)

b) කිරි ගම්මාන ඇති කිරීම
කිරි නිෂ්පාදන විවිධාංගිකරණය
කිරි නිෂ්පාදන ආශ්‍රිත වෙළඳපොළ පුළුල් කිරීම
උසස් දෙනුන් ගෙන්වා බෙදා හැරීම කරුණු දෙක දැක්වීමට (ල. 02)
කරුණු දෙක විස්තර කිරීමට (ල. 01) (ල. 05)

(07) (i) භෝග වගා කිරීමට
ශාක වර්ධනයට
සාගරයේ මසුන්ගේ වර්ධනය (ල. 02)

(ii) ෆොසිල ඉන්ධන දහනය
වන හායනය
සත්ත්ව පාලනය (වමාරාකන)
ඝන අපද්‍රව්‍ය බැහැරලීම
ගිනි තැබීම ක්‍රියාකාරකම් දෙකට (ල. 02)
එක් කරුණක් විස්තර කිරීම (ල. 01) (ල. 03)

(iii) හරිතාකාර වායු පිටකරන බලශක්ති භාවිතය අඩු කිරීම
පුනර් ජනනීය බලශක්ති භාවිතය දිරි ගැන්වීම
වන වගාව ව්‍යාප්ත කිරීම
ඝන අපද්‍රව්‍ය කළමණාකාරණය කිරීම
පොදු ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම කරුණු දෙක දැක්වීමට (ල. 02)
කරුණු දෙක විස්තර කිරීමට (ල. 03) (ල. 05)

(08) (i) 06
02 (ල. 02)

(ii) විදේශ විනිමය ලැබීම
ඍජු හා වක්‍ර රැකියා අවස්ථා ලැබීම
යටිතල පහසුකම් දියුණු වීම
දේශීය නිෂ්පාදන සඳහා වෙළඳපොල බිහිවීම (ල. 03)

(iii) සංස්කෘතිකමය ගැටළු මතුවීම
වසංගත රෝග පැතිරීම
සංචාරකයින් සඳහා පහසුකම් මඳවිම
දේශපාලන අස්ථාවරතාවය
සංචාරකයින්ගෙන් විවිධ කටයුතු සඳහා අයකරන ගාස්තු අධික වීම
කරුණු තුනක් දැක්වීම (ල. 03)
කරුණක් විස්තර කිරීමට (ල. 02) (ල. 05)